// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1725/26 – 2011 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා – 2011.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: එන්සීපී/අයිජ්/17/13/4/1349.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2008/ඩබ්එස්/304.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, උතුරු කලාගම් කෝරළේ සුළු කොට්ඨාශයේ, විජිතපුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2011.08.26 දිනැති අ.ග.පි 850 අතිරේක අංක 8 පත්‍ර අංක 10 දරන පිඹුරේ කැබලි අංක 243 සිට 246 දක්වා වූ පහත නම් වලින් යුතු හෙක්. 0.0706 ක් පමණ වන, පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් හතර (4).

**කැබලි අංක 243**
ඉඩමේ නම: විජිතපුර ලන්ද; හිමිකම් කියන අය: නාගූර් පිච්චේ මොහොමඩ් නිසාර්, පොල්වත්ත, විජිතපුර; ප්‍රමාණය: හෙක්. 0.0091.
උතුරට: කැබලි අංක 248; නැගෙනහිරට: කැබලි අංක 248; දකුණට: කැබලි අංක 248, 244, 246 සහ 245; බටහිරට: කැබලි අංක 246 සහ 248.

**කැබලි අංක 244**
ඉඩමේ නම: විජිතපුර ලන්ද; හිමිකම් කියන අය: නාගූර් පිච්චේ මොහොමඩ් නිසාර්, පොල්වත්ත, විජිතපුර; ප්‍රමාණය: හෙක්. 0.0043.
උතුරට: කැබලි අංක 243 සහ 248; නැගෙනහිරට: කැබලි අංක 248; දකුණට: කැබලි අංක 247 සහ 246; බටහිරට: කැබලි අංක 246, 245 සහ 243.

**කැබලි අංක 245**
ඉඩමේ නම: විජිතපුර ලන්ද; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0338.
උතුරට: කැබලි අංක 246, 248, 243 සහ 244; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 246; බටහිරට: කැබලි අංක 246.

**කැබලි අංක 246**
ඉඩමේ නම: විජිතපුර ලන්ද; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0234.
උතුරට: කැබලි අංක 243, 244, 248 සහ 247; නැගෙනහිරට: කැබලි අංක 247; දකුණට: කැබලි අංක 247, 62 සහ 248; බටහිරට: කැබලි අංක 245.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 නොවැම්බර් මස 16 වැනි දින ප.ව. 2.00 ට ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 නොවැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

රුවන් පාලිත සත්කුමාර,
ප්‍රාදේශීය ලේකම්.
ඉපලෝගම.

2011 සැප්තැම්බර් මස 27 වැනි දින,
ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 – 365

1A – G 15127 – 350 (2011 / 10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.